*සැ. යු.* - 2018.04.27 දින පළ වූ අංක 2069 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,070 - 2018 මැයි මස 04 වැනි සිකුරාදා - 2018.05.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 952 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 953 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 954 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 959 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 963 |


*සැ. යු.* - සූතිකාධාර (සංශෝධන) පනත් කෙටුම්පත 2018 අප්‍රේල් මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 මැයි මස 25 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 මැයි මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## මහාධිකරණය - බදුල්ල

### රාජසන්තක කරන ලද මෝටර් වාහන ටෙන්ඩර් මඟින් විකිණීම

මහියංගන දිසා/මහේස්ත්‍රාත් අධිකරණය, බදුල්ල මහේස්ත්‍රාත් අධිකරණය හා බණ්ඩාරවෙල, මහේස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද පහත විස්තර සඳහන් රථ වාහන ටෙන්ඩර් මඟින් විකිණීම සඳහා මිලගණන් කැඳවනු ලැබේ.

1. ටෙන්ඩර් පෝරමපත් නිකුත් කිරීම : 2018.05.21 සිට 2018.06.05 දක්වා
2. ටෙන්ඩර් මිල ගණන් පත් භාර ගැනීමේ අවසන් දිනය : 2018.06.26 ප.ව. 01.00 දක්වා
3. ටෙන්ඩර් පත් විවෘත කිරීම 2018.06.26 දින ප.ව. 2.00 ට බදුල්ල, මහාධිකරණ කාර්යාලයේදී පැවැත්වේ.

02. ටෙන්ඩර් අයදුම්පත් එවිය යුතු ලිපිනය : සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, ඌව පළාත්බද මහාධිකරණය, බදුල්ල''යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් 2018.06.26 දිනට පෙර එවිය යුතු අතර, ටෙන්ඩර් අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අදාල වාහන අංකය සමඟ'' වාහන සඳහා මිල ගණන් පත් ඉදිරිපත් කිරීම'' යනුවෙන් සඳහන් කර එවිය යුතුයි.

03. ටෙන්ඩර් පෝරමපත් බදුල්ල මහාධිකරණ කාර්යාලයෙන් ලබා ගත හැකි අතර, ටෙන්ඩර් මඟින් විකිණීමට යෝජිත වාහනයේ විස්තර හා ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවිය යුතු ආකාරය පහත දැක්වේ.

| *අධිකරණය* | *වාහන වර්ගය හා විස්තරය* | *වාහන අංකය* | *අවම ලංසු මුදල* | *ටෙන්ඩර් ඇප තැන්පත්* | |
|---|---|---|---|---|---|
| | | | | *ආපසු නොගෙවන මුදල* | *ආපසු ගෙවන මුදල* |
| | | | *රු.* | *රු.* | *රු.* |
| මහෙස්ත්‍රාත් අධිකරණය බදුල්ල | පියාජියෝ ත්‍රීරෝද රථය | QS 6996 | 140,000.00 | 100.00 | 2000.00 |
| | FOTON ලොරි රථය | PU 5327 | 4,00,000.00 | 100.00 | 5000.00 |
| | JAC වර්ගයේ මෝටර් ලොරි | LC 2086 | 350,000.00 | 100.00 | 5000.00 |
| | ISUSU ලොරි රථය | 42-7319 | 400,000.00 | 100.00 | 5000.00 |
| මහෙස්ත්‍රාත් අධිකරණය බණ්ඩාරවෙල | ටොයෝටා ලොරි රථය | 47-5162 | 170,000.00 | 100.00 | 2000.00 |
| | ISUSU ලොරි රථය | 47-3590 | 350,000.00 | 100.00 | 5000.00 |
| දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය මහියංගනය | JAC වර්ගයේ මෝටර් ලොරි - Diesel | LC 3279 | 50,000.00 | 100.00 | 1000.00 |
| | Foton ලොරි රථය | PP - 4701 | 200,000.00 | 100.00 | 2000.00 |

04. වාහනය පරීක්ෂා කිරීම මහියංගන දිසා මහේස්‍රාත් අධිකරණය, බදුල්ල මහේස්ත්‍රාත් අධිකරණය හා බණ්ඩාරවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර් වරුන්ගේ හා රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය මත ඒ ඒ අධිකරණ භූමියන් හිදී, 2018.05.07 සිට 2018.05.18 දින දක්වා කාලය තුල පෙ.ව. 9.00 සිට ප.ව. 3.30 දක්වා කාර්යාල වේලාවන්හිදී සිදුකළ හැකිය.

05. ජයග්‍රහණය කරනු ලබන ලංසුකරු වෙත ඒ බව ලිඛිතව දැනුම්දෙනු ලබන අතර. එම දැන්වීම ලැබීමෙන් අනතුරුව, අදාල ලංසුකරු විසින් සතියක් ඇතුලත අනිවාර්යයෙන්ම ගෙවිය යුතු සම්පූර්ණ මුදල අදාල අධිකරණයට මුදලින් ගෙවා, එකී වාහනය අධිකරණ භූමියෙන් ඉවත් කර ගැනීමට කටයුතු කළ යුතුය.

06. බදුල්ල මහාධිකරණයේ ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

තුසිත දේවප්‍රිය ගුණසේකර,
මහාධිකරණ විනිසුරු,
ඌව පළාත්බද මහාධිකරණය,
බදුල්ල.

2018 අප්‍රේල් මස 02 වැනි දින,
බදුල්ල ඌව පළාත්බද මහාධිකරණයේ දී ය.

05-16

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

Axles පරීක්ෂා කිරීම සඳහා A-Scan, Pulse Echo මාදිලියේ Ultra Sonic Flaw Detectors 06 (හයක්) සැපයීමේ ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන අංකය - SRS/ F. 7502

01. ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවයට ඇක්සල් (Axles) පරීක්ෂා කිරීම සඳහා A-Scan, Pulse Echo Type UltraSonic (අතිධ්වනි) Flaw Detectors (දෝෂ අනාවරණක) (හයක්) 06 සැපයීම ප්‍රසම්පාදන සඳහා නිපැයුම්කරුවන්/ සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

ලංසු සමග ඉදිරිපත් කරනු ලබන අයිතමයේ සැපයීම හා සම්බන්ධව නිෂ්පාදකයින්ගේ බලය පැවරීමේ ලිපිද ඉදිරිපත් කළ යුතු ය. විදේශීය ලංසුකරුවන්හට සිය ඇටර්නි බලය මගින් බලගන්වන ලද හා ශ්‍රී ලංකාවේ, කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් හා ලියාපදිංචි වී ඇති, බලයලත් දේශීය ඒජන්තවරයෙකු/ නියෝජිතවරයෙකු මාර්ගයෙන්, ස්වකීය ලංසු ඉදිරිපත් කළ හැකි ය.

02. ලංසු භාර ගැනීම 2018.05.31 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප.ව. 2.00ට අවසන් වනු ඇත.

03. ලංසු, ශ්‍රී ලංකා රුපියල් පන්දහස් තුන්සීයක (රු. 5,300.00) ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවීමෙන් ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය වෙතින් ලබාගත හැකි ලංසුකරණ ලිපිලේඛන වල දක්වෙන 2018.04.18 වැනි දින සිට 2018.05.30 වැනි දින දක්වා, සාමාන්‍ය රාජකාරී දිනවල දී (ශ්‍රී ලංකා වේලාවෙන්) පැය 09.00 සිට පැය 15.00 දක්වා අතරතුර දී ලබාගත හැකි, ආකෘතිපත්‍ර/(ෆෝරම) මත ඉදිරිපත් කළ යුතු ය. විදේශීය ලංසුකරුවන්හට, සිය රටවල ශ්‍රී ලංකා තානාපති දූත කාර්යාලවලට ශ්‍රී ලංකා රුපියල් පන්දහස් තුන්සියයක (රු. 5,300.00) කට සම වන, වටිනාකමින් යුත් පහසුවෙන් පරිවර්තනය කර ගත හැකි විදේශීය මුදල් වර්ගයකින් සමාන මුදලක්, ගෙවා ඉහත දක්වා ඇති විශේෂිත දින වකවානු තුළ දී ලංසු ලේඛන, තමන්ට යොමු කරන මෙන්, අදාළ ශ්‍රී ලංකා තානාපති දූත කාර්යාලය මාර්ගයෙන් ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී වෙත ඉල්ලුම් කල හැකිය. එම ඉහත සඳහන් රුපියල් පන්දහස් තුන්සීයක (රු. 5,300.00) ක ප්‍රසම්පාදන ගාස්තුව, (හෝ විදේශීය මුදල් වර්ගයකින් පරිවර්තනය කරගත හැකි සමාන මුදලක්) ආපසු ගෙවනු නොලබන ගාස්තුවක් වන්නේ ය.

04. ලංසු, එම ලංසු භාරගන්නා වේලාව ඉක්මවූ වහාම, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී විවෘත කරනු ලැබේ. එම ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින ලෙස, ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයින් ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත ලිපිනයට අතින් ගෙනැවිත් භාරදීම, ලේඛනගත (ලියාපදිංචි කළ) තැපෑලෙන් එවීම හෝ කළ යුතු වන්නේ ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය,
ඕල්කට් මාවත, කොළඹ 10.

06. ලංසු ලිපිලේඛන ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකි ය.

07. වැඩිදුර විස්තර තොරතුරු සඳහා.
දුරකතන අංකය : 94(11)2438078/2436818.
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය SRS/F. 7502

05-35

# බඩු බාහිරාදිය විකිණීම්

**දිසා අධිකරණය - ඇඹිලිපිටිය**

භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඇඹිලිපිටිය දිසා අධිකරණයේ භාවිතයෙන් ඉවත් කරන ලද පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2018.05.22 වැනි දින පෙ.ව. 9.00 ට ඇඹිලිපිටිය දිසා අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. වෙන්දේසිය පැවැත්වෙන දින පෙ.ව. 8.30 සිට පෙ.ව. 9.00 දක්වා අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබාගෙන වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.

03. වෙන්දේසියේදී අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවන්හිදී අධිකරණයේ අභිමතය පරිදි එකී භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු වේ.

04. වෙන්දේසියේදී මිලදී ගන්නා භාණ්ඩ එවේලේම මුදලින් ගෙවීම් කල යුතු අතර, වෙන්දේසි දින ප.ව. 4.00 ට පෙර එම භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

05. භාණ්ඩ මිලදී ගන්නා පුද්ගලයින් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

06. මෙම වෙන්දේසිය පිළිබඳ පැමිණිලි කිසිවක් වෙතොත් වෙන්දේසි දින රාජකාරි අවසන් වීමට පෙර අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දියයුතු අතර පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

මෙම වෙන්දේසිය පිළිබඳ සියලු කටයුතු අධිකරණයේ අභිමතය පරිදි සිදු කරනු ලබන බවද දන්වා සිටිනු ලැබේ.

ජනක කැකිරිදෙණිය,
දිසා විනිසුරු,
දිසා අධිකරණය,
ඇඹිලිපිටිය.

2018 අප්‍රේල් 09 වැනි දින,
ඇඹිලිපිටිය දිසා අධිකරණයේ දී ය.

උපලේඛනය

| අනු. අංකය | භාණ්ඩය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | විධායක පුටු | 01 |
| 02. | Lexmarkවර්ගයේ මුද්‍රණ යන්ත්‍ර (9959 X DB) | 01 |
| 03. | D. C. P. වර්ගයේ U. P. S. යන්ත්‍ර | 02 |
| 04. | වානේ කැබිනට් | 04 |
| 05. | ගොඩ්රිජ් වර්ගයේ යතුරු ලියන | 04 |
| | කේත අංකය 1118556 (ඉංග්‍රීසි) | |
| | කේත අංකය 1111385 (සිංහල) | |
| | කේත අංකය 1111380 (සිංහල) | |
| | කේත අංකය 1111388 (සිංහල) | |
| 06. | පරිගණක පුටු | 01 |

05-14

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

මගේ අංකය : ARA/ADM/ADMIN/6/7/5.

## ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2018/2019 වර්ෂය

2018 ජූලි සිට 2019 ජූනි දක්වා

2018 ජූලි 01 දින සිට 2019 ජූනි 30 දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු 20 වන දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළවී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අද ාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් මුදල් තැන්පත් කල බවට ලබා ගත් කුවිතාන්සියක් හා අ ද ා ළ ටෙන්ඩරයේ සඳහන් මිල පරිමාණයෙන් යටත් පිරිසයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතුය.

3. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ එම කෙලවරෙහි අංක............. රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය යනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි තැබෑරුම් නම සහ අංකය සඳහන් කොට 2018.05.18 වන දින පෙ.ව. 10.30 ට පෙර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

4. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා 1982.08.20 වැනි දින පළවී ඇති අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසි වලට අනුකූල විය යුතුය.

5. 2018.05.18 වැනි දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කල වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ තැබෑරුම් සඳහා නැවත විකිණීම 2018.06.05 දින පෙ.ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම යථොක්ත ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

6. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ආරච්චිකට්ටුව.

**උපලේඛනය**

| *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරම් අංකය* | *ටෙන්ඩර් භාර ගන්නා අවසන් දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් කල යුතු මුදල රු.* |
|---|---|---|---|---|
| ආරච්චිකට්ටුව | කරුපනේ | 10 | 2018.05.18 පෙ.ව. 10.30 | 1,000 |
| ආරච්චිකට්ටුව | ආරච්චිකට්ටුව | 11 | 2018.05.18 පෙ.ව. 10.30 | 1,000 |
| ආරච්චිකට්ටුව | බත්තුළුඔය | 12 | 2018.05.18 පෙ.ව. 10.30 | 1,000 |

05-31

---

**මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

2018/2019 වර්ෂය සඳහා මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම

01. 2018 ජුලි මස 01 වැනි දින සිට 2019 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසිය හා සෑම සුරාබදු බලපත්‍රයක් ම සඳහා අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණය යටත් පිරිසෙන් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතුයි.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ "අංක 13 දරන පම්බල රා තැබෑරුම" සඳහා ටෙන්ඩර් පත්‍රය යනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි රා තැබෑරුමෙහි නම සහ අංකය සඳහන් කොට 2018 මැයි මස 25 වැනි දින පෙ. ව. 10.30 ට පෙර මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුයි.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

05. 2018 මැයි මස 25 වැනි දින පෙ. ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු යි.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2018.06.12 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අදාළ විය යුතු ය.

මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

එච්. එම්. එස්. පී. හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
මාදම්පේ.

2018 අප්‍රේල් මස 18 වැනි දින,
මාදම්පේ,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *තැබෑරුම් අංකය* | *ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|---|---|
| උතුරු පිටිගල් කෝරළය | පම්බල | පෙ. ව. 11.00<br>ප. ව. 5.00 | ප. ව. 2.00<br>ප.ව. 8.00 | 13 | 2018.05.25<br>පෙ. ව. 10.30 | 1,000.00 |

05-98

---

## මුන්දලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - පුත්තලම දිස්ත්‍රික්කය

### රා තැබෑරුම් රේන්ද විකිණීම - (2018/2019 වර්ෂය) 2018 ජූලි මස 01 සිට 2019 ජුනි මස 30 දක්වා කාලය සඳහා

2018 ජූලි මස 01 වැනි දින සිට 2019 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි සහ සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගන්නා නියමිත ආකෘති පත්‍රයෙන් සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සිය හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සැලසුම් කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ "අංක.................................... දරන......................................... රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ අංකය සහ නම සඳහන් කොට 2018.05.24 වැනි දින පෙ.ව. 10.30 ට පෙර මුන්දලම ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර මුන්දලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ තබා ඇති, ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතු ය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට ඇතුළත් විය යුතු ය.

05. 2018.05.24 වැනි දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2018.06.14 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම යථෝක්ත ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.
(දුරකථන අංක : 032-2052271).

ඒ. එම්. සී. එම්. ප්‍රේමසූරිය,
ප්‍රාදේශීය ලේකම්,
මුන්දලම.

2018 අප්‍රේල් මස 18 වැනි දින,
මුන්දලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| අනුක්‍රමික අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාමය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශත |
|---|---|---|---|---|---|---|
| 01. | මුන්දලම | මුන්දලම | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 2018.05.24<br>පෙ.ව. 10.30 | 1,000 0 |
| 02. | මුන්දලම | මදුරන්කුලිය | පෙ.ව.11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 2018.05.24<br>පෙ.ව.10.30 | 1,000 0 |
| 03. | මුන්දලම | මුක්කුතොඩුවාව | පෙ.ව. 11.00<br>ප.ව.5.00 | ප.ව.2.00<br>ප.ව.8.00 | 2018.05.24<br>පෙ.ව.10.30 | 1,000 0 |
| 04. | මුන්දලම | උඩප්පුව | පෙ.ව.11.00<br>ප.ව.5.00 | ප.ව.2.00<br>ප.ව.8.00 | 2018.05.24<br>පෙ.ව.10.30 | 1,000 0 |

05-109

---

**මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

2018 ජූලි මස 01 වැනි දින සිට 2019 ජුනි මස 30 දක්වා කාලය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම - 2018/2019 වර්ෂය

2018 ජූලි මස 01 වැනි දින සිට 2019 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව, එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

(2) සෑම ටෙන්ඩරයක් ම ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ම ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් කළ යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබා ගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිළ ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15% ට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

(3) විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනත වම් කෙළවරෙහි "අංක............................................ රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන්, පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2018.05.23 දින පෙ.ව. 10.30 ට පෙර මහවැව ප්‍රාදේශීය ලේකම් ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

(4) ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

(5) 2018.05.23 වැනි දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ දී සියලුම ටෙන්ඩර්කරුවන් මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

(6) පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2018.06.13 දින පෙ.ව. 10.30ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම යථෝක්ත *ගැසට්* නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

(7) මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය. (දුරකථන අංකය : 032 -2254231, 0322252061).

එම්. ඩී. නන්දසිරි,
ප්‍රාදේශීය ලේකම්,
මහවැව.

2018 අප්‍රේල් මස 04 වැනි දින,
මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *රා තැබෑරුම් අංකය* | *ග්‍රාමය* | *තැන්පත් මුදල රු. ශත* |
|---|---|---|
| 16 | අඩප්පරගම | 500 0 |
| 17 | මට්ටාකොටුව | 500 0 |
| 18 | තොඩුවාව (උතුර) | 1,000 0 |

05-15

# රජයේ නොවන දැන්වීම්

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 09 (01) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : පියෝරිච් සිලෝන් (පී වී ටී) එල් ටී ඩී
සමාගමේ අංකය : පී වී 131410
සමාගම ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 86/සී1, රුවන් පෙදෙස, කටුවාවල, බොරලැස්ගමුව
සංස්ථාගත කළ දිනය : 2018.04.03

සමාගම් ලේකම්.

05-99

---

## පොදු නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 8 ඡේදයේ නියමයන්ට අනුකූලව ''ලොජිවෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' නාමය ඇඩ්වාන්ටිස් ප්‍රොජෙක්ට්ස් ඇන්ඩ් ඉංජිනියරින් (පීවීටී) එල්ටීඩී'' වශයෙන් වෙනස් කළ බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) ඡේදය යටතේ මින් නිවේදනය කරනු ලැබේ.

සමාගම කලින් හැඳින්වූ නාමය : ලොජිවෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී බී 552 පී වී
ලියාපදිංචි කාර්යාලය : අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10
සමාගමේ නව නාමය : ඇඩ්වාන්ටිස් ප්‍රොජෙක්ට්ස් ඇන්ඩ් ඉංජිනියරින් (පීවීටී) එල්ටීඩී

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

හේලීස් ගෲප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2018 අප්‍රේල් මස 16 වැනි දින,
400, ඩීන්ස් පාර,
කොළඹ 10.

05-103

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියට අනුගාමීව සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ වික්ටරි ෆාම් (පුද්ගලික)

සමාගම ලියාපදිංචි අංකය : පී වී 130802
ලියාපදිංචි ලිපිනය : වික්ටරි ෆාම්, කටුකැලියාව පාර, මින්නේරිය

සමාගම් ලේකම්.

05-113

## ග්‍රීන් ලංකා ෂිපිං ලිමිටඩ්

සමාගමේ ලියාපදිංචි අංකය පීබී 702

2007 අංක 07 දරන සමාගම් පනතේ 346 (1) වගන්තිය යටතේ ඇවරකරුගේ පත්වීමේ දැන්වීම

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | ග්‍රීන් ලංකා ෂිපිං ලිමිටඩ් |
| ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය | : | ග්‍රීන් ලංකා ටවර් අංක 46/46, නවම් මාවත, කොළඹ 02 |
| උසාවිය | : | බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය (කොළඹ සිවිල්) |
| නඩු අංකය | : | HC(CIVIL) 49/2016 CO |
| ඇවරකරුගේ නම | : | ජී. ජේ. ඩේවිඩ් ඇවරකරු SJMS ඇසෝසියේට්ස් බාරේ, ප්‍රතිව්‍යුහගත කිරීම හා ආයතනික අයකර ගැනීම් 3 වන මහල, අංක 11, කාසල් පටුමග, කොළඹ 04 |
| පත්වීමේ දිනය | : | 2018 අප්‍රේල් 06 |

05-110/1

---

## ග්‍රීන් ලංකා ෂිපිං ලිමිටඩ්

සමාගමේ ලියාපදිංචි අංකය පීබී 702

2007 අක 07 දරන සමාගම් පනතේ 270 (ඉ) සහ (ඊ) වගන්තිය යටතේ පරිවෘත කිරීමේ නියෝගය

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | ග්‍රීන් ලංකා ෂිපිං ලිමිටඩ් |
| ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය | : | ග්‍රීන් ලංකා ටවර් අංක 46/46, නවම් මාවත, කොළඹ 02 |
| උසාවිය | : | බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය (කොළඹ සිවිල්) |
| නඩු අංකය | : | HC(CIVIL) 49/2016/CO |
| නියෝගය දුන් දිනය | : | 2018 අප්‍රේල් 03 |
| පෙත්සම ඉදිරිපත් කළ දිනය | : | 2016 සැප්තැම්බර් 21 |
| ඇවරකරුගේ නම | : | ජී. ජේ. ඩේවිඩ් |
| ලිපිනය | : | ඇවරකරු SJMS ඇසෝසියේට්ස් බාරේ, ප්‍රතිව්‍යුහගත කිරීම හා ආයතනික අයකර ගැනීම් 3 වන මහල, අංක 11, කාසල් පටුමග, කොළඹ 04 |

05-110/2

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 වගන්තිය ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නාමය : ප්‍රෝබයික් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 128730
ලියාපදිංචි ලිපිනය : අංක 367, පයිප් පාර, හොරගහකන්ද පටුමග, තලංගම උතුර, කොස්වත්ත, බත්තරමුල්ල
සංස්ථාගත කළ දිනය : 2018.01.09

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

05-119

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 දරන වගන්තිය අනුව පහත දක්වෙන සමාගම ස්ථාපිත කළ බව අපි මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නම : සෝප්‍රානෝස් කළම්බු (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 130911
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
සමාගම ස්ථාපිත කළ දිනය : 2018.03.29

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

05-120

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 දරන වගන්තියට අනුව පහත සමාගම ස්ථාපිත කළ බව අපි මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නම : රූට් මොබයිල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 131044
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
සමාගම ස්ථාපිත කළ දිනය : 2018.03.23

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

05-121

## ප්‍රසිද්ධ නිවේදනයයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කෙරේ.

සමාගමේ නම : ටර්කි ටෙන් ඉංජිනියරින් කන්සල්ටන්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 131314
ලියාපදිංචි ලිපිනය : අංක 41/1, බෝගහවිල පාර, හිරිටිපිටිය, පන්නිපිටිය
සංස්ථාපනය කළ දිනය : 2018.04.02

සමාගම් ලේකම්.

05-123

## පොදු නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 8 ඡේදයේ නියමයන්ට අනුකූලව "එන්.වයි.කේ. ලයින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්" නාමය "එන්.වයි.කේ. ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්" වශයෙන් වෙනස් කළ බව 2007 අංක 07 දරණ සමාගම් පනතේ 9(2) ඡේදය යටතේ මින් නිවේදනය කරනු ලැබේ.

සමාගම් කලින් හැඳින්වූ නාමය : එන්.වයි.කේ. ලයින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම අංකය : පීවී 5088
ලියාපදිංචි කාර්යාලය : අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10
සමාගමේ නව නාමය : එන්.වයි.කේ. ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

හේලීස් ග්‍රෑප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 400,
ඩීන්ස් පාර,
කොළඹ 10.
2018 අප්‍රේල් මස 23 වැනි දින.

05-67

## ඒකාබද්ධ කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 242 වන වගන්තිය යටතේ ලංකා මාර්කට් රිසර්ච් බියුරෝ (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම 2018 මාර්තු මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ටී එන් එස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සමග ඒකාබද්ධ කර ඇති බව මෙයින් නිවේදනය කරන අතර, 2007 අංක 07 දරන සමාගම් පනතේ 244(1) (අ) වන වගන්තියට අනුව ඒකාබද්ධ කිරීමේ සහතිකය නිකුත් කර ඇත.

ඒකාබද්ධිත සමාගමේ නම : ටී එන් එස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම

ඒකාබද්ධිත සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 32/4, නාරාහේන්පිට පාර, නාවල

ඒකාබද්ධ කිරීමේ බලාත්මක වන දිනය : 2018 මාර්තු මස 01 වැනි දින

ඒකාබද්ධිත සමාගමේ ලියාපදිංචි අංකය : PV 7228

05-70

---

## ඒකාබද්ධ කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 240 සහ 241 වන වගන්ති යටතේ දිදුල් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම, වෙස්වින් කන්ස්ට්‍රක්ෂන් නක්කාවිට (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම, පැන්ටැක් පවර් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සහ සමන්ගිරි හයිඩ්‍රෝ ඉලෙක්ට්‍රික් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම, 2018 මාර්තු මස 30 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඩබ්ලිව් කේ වී හයිඩ්‍රෝ ටෙක්නික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සමග ඒකාබද්ධ කර ඇති බව මෙයින් නිවේදනය කරන අතර, 2007 අංක 07 දරන සමාගම් පනතේ 244(1) (අ) වන වගන්තියට අනුව ඒකාබද්ධ කිරීමේ සහතිකය නිකුත් කර ඇත.

ඒකාබද්ධිත සමාගමේ නම : ඩබ්ලිව් කේ වී හයිඩ්‍රෝ ටෙක්නික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම

ඒකාබද්ධිත සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 12, දොන් කරෝලිස් පාර, කොළඹ 05

ඒකාබද්ධ කිරීම බලාත්මක වන දිනය : 2018 මාර්තු මස 30 වැනි දින

ඒකාබද්ධිත සමාගමේ ලියාපදිංචි අංකය : PV 11882

05-69

---

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ නිවේදනය

සමාගමේ නම : ද ග්‍රේටස්ට් ලංකාස් කම්පැණි (පීවීටී) එල්ටීඩී

සමාගමේ අංකය : පීවී : 128493

දිනය : 2017 දෙසැම්බර් 28

ලියාපදිංචි කාර්යාලය : # 65/1, ශාන්ත මේරිස් පාර, කොළඹ 15.

පෙරියසාමි මදුෂාන්.
ලේකම්.

05-24

---

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම සම්බන්ධ ප්‍රසිද්ධ දැන්වීම

සමාගමේ නම : උමාමහේෂ්වරන් ෆවුන්ඩේෂන්

සංස්ථාගත කළ දිනය : 2018.01.22

ලියාපදිංචි කළ අංකය : පී/ඒ 3444

ලියාපදිංචි කළ කාර්යාල ලිපිනය : අංක 22, සිවන්කෝවිල් හරස් පාර, සින්නපුදුක්කුලම්, වව්නියා.

චන්ද්‍රවදනි වාසවන්,
සමාගම් ලේකම්.

05-20

---

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ නිවේදනය

සමාගමේ නම : ශ්‍රී ෂාන් ලංකා (පීවීටී) එල්ටීඩී

ලියාපදිංචි කළ අංකය : පීවී 127966

ලියාපදිංචි කළ දිනය : 2017 දෙසැම්බර් 12

ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය : H 48/ඒ, ගල්පොත වීදිය, කොළඹ 13.

පෙරියසාමි මදුෂාන්,
ලේකම්.

05-23

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ඉලෙවන් ටු ඉලෙවන් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ අංකය : පීවී 118362

ලියාපදිංචි කාර්යාලය ලිපිනය : 132, කරුකෙරියව, බුබෝගම, දඹුල්ල.

සංස්ථාගත දිනය : 2016.11.28

එන්. පාර්තිපන්,
සමාගමේ ලේකම්.

05-22

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ලෙදර් ඇස්සා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 129517
ලියාපදිංචි කාර්යාලය ලිපිනය : අංක 88, මූලායි නැගෙනහිර, චුලිපුරම්.
සංස්ථාගත දිනය : 2018.02.05

එන්. පාර්තිපන්,
සමාගමේ ලේකම්.

05-21

---

## විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

